

Our practice is based on three main principles; Fairness, Compassion and Deliver Results. We pledge our commitment to further enhance these principles in our service to you........

Susantha Katugampala

SUSANTHA KATUGAMPALA
LL B (Monash)

Barrister & Solicitor
Registered Migration Agent: 96/86306
Australian qualified and experienced Sri Lankan Lawyer

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

10, Morrison Place, East Melbourne 3002
Telephone: 03 9650 4557 Fax: 03 9650 4559
Interstate Callers: 1300 888 331

Email: fairfields.lawyers@bigpond.com

We Deliver Results.....

Design / Waruna Savinda / 0402 894 942

නිවැරදි ආකාරයට නම්, මෙවැනි තීරණාත්මක ප්‍රශ්නයකදී රජයට නිශ්චිත ප්‍රතිපත්තියක් තිබිය යුතුය. නමුත් මේ රජයට එවැනි දෙයක් නැත. කෝටි දෙකක පමණ ජනතාවක් වාසය කරන ලංකාවේ ජනතාවගේ අනාගත පැවැත්ම උදෙසා තීන්දු හා තීරණ ගන්නා මහින්ද රාජපක්ෂ ආණ්ඩුවත් හරියට ජාතික හෙළ උරුමය වගේය. කිසිම ප්‍රතිපත්තියක් නැත. එක වචනයක් නැත. තම පුද්ගලික පැවැත්ම උදෙසා දිව දෙකෙ කතා කියන පිරිසක් බවට පත්වී ඇත.

අද හෙළ උරුමයත් එලෙසය. එදා ''සටන් විරාම ගිවිසුම'' අහෝසි කිරීමට හා නෝර්වේ නියෝජිතයින් රටින් පිටුවහල් කිරීමට පෙරමුණ ක්‍රියා කළ එක් පාර්ශවයක් නම්, ජාතික හෙළ උරුමයයි. නමුත් අද ඔවුන් තුළින් එවැනි තත්ත්වයක් දක්නට නැත. ගිවිසුම ඉරා දැමීමක් හෝ නෝර්වේ රටින් පැන්නීමක් ගැන කතා කරන්නේ නැත.

පසුගියදා සිදුවූ අමාත්‍ය මණ්ඩල සංශෝධනය වනතුරු ඒ ගැන කතා කළේය. නමුත් අමාත්‍ය මණ්ඩල සංශෝධනය හරහා ජාතික හෙළ උරුමයට ඇමැති තනතුරක් ලැබුණු අතර ඉන්පසුව ඔවුන් ගායනා කරමින් රඟපාන්නේ වෙනත් නැටුමකි. ''වාසි පැත්තට හෝයියා'' යන පදයට කකුල් තියෙන හෙළ උරුමය අද කියන්නේ ''මළ කුණක් බවට පත්වී ඇති සටන් විරාම ගිවිසුම ගැන කතා කිරීමෙන් ඵලක් නැති බවය. ඔවුන් ප්‍රකාශ කරන ආකාරයට සටන් විරාම ගිවිසුම මැරිලා නම්, එම මළ කුණ තවදුරටත් ගඳ ගගා ගේ මැද්දේ තබා ගෙන සිටින්නේ ඇයි එය වළ දැමිය යුතුය. සටන් විරාම ගිවිසුමත් එසේය. ගිවිසුමේ ක්‍රියාත්මක භාවය අඩපන වී ඇත්නම්, ඒ දෙස තවදුරටත් බලා නොසිට ගිවිසුම අහෝසි කර නෝර්වේ ඒජන්තයින් රටින් පිටුවහල් කළ යුතුය. එසේ නොකර තවදුරටත් කල්යල් බලමින් සිටින්නේ ඇය?

මහින්ද රාජපක්ෂ මහතාගේ ''මහින්ද චින්තන'' ආණ්ඩුවට සහය දීමට නම්, ගිවිසුම අහෝසි කර නෝර්වේ අය රටින් යැවිය යුතු බවට හෙළ උරුමය ජනාධිපතිවරණ සටනේදී මහින්ද රාජපක්ෂ මහතාගෙන් සහතිකයක් ලබා ගත්තේ මහනුවර දළදා මාළිගාව අභියස සිටය. නමුත් ඒ සහතිකය අද වනතුරුත් ඉෂ්ඨ කිරීමට රාජපක්ෂ ආණ්ඩුව පියවර ගෙන නැත.

එය ඉටුකර ගැනීම හෙළ උරුමය පැත්තෙන්ද කිසිදු දායකත්වයක් සපයන්නේ නැත. මේ හේතුකොට ගෙන සහතික ගත් හෙළ උරුමයත්, සහතික දුන් රාජපක්ෂ ආණ්ඩුවත් අද ජනතාව ඉදිරියේ බොරුකාරයන් බවට පත්වී ඇත.

*සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම, නෝර්වේ ඒජන්තයින් රටින් පිටුවහල් කිරීම යන කරුණු මුල් කරගෙන මේ රටේ වැඩිපුරම හඬ නැගුවේ ජාතික හෙළ උරුමය හා ජනතා විමුක්ති පෙරමුණය. අද හෙළ උරුමය ඇමැතිකමක් ලැබීමෙන් එය පවා දුන්නත්, ජනතා විමුක්ති පෙරමුණ තවමත් එම සටනේ නියැලී සිටී.*

මේ දෙපාර්ශවයම බොරු කර ඇත්තේ සාමාන්‍ය තැනකට නොවේ. බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වූ මහනුවර දළදා මාළිගාව අභියස සිටය. දළදා මාළිගාවට මල් පහන් පූජා කරමින්, පඬුරු බදිමින් පොරොන්දු ඉටු කරන බවට දෙපාර්ශවය දිවුරා පොරොන්දු වුවත්, ඒවා ඉටු නොකිරීමෙන් පෙන්නුම් කරන්නේ මේ අය බොරු කර ඇත්තේ රටේ මහජනතාවට පමණක් නොව උතුම් වු දළදා මාළිගාවටද බොරු කර ඇති බවය.

සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම, නෝර්වේ ඒජන්තයින් රටින් පිටුවහල් කිරීම යන කරුණු මුල් කරගෙන මේ රටේ වැඩිපුරම හඬ නැගුවේ ජාතික හෙළ උරුමය හා ජනතා විමුක්ති පෙරමුණය. අද හෙළ උරුමය ඇමැතිකමක් ලැබීමෙන් එය පවා දුන්නත්, ජනතා විමුක්ති පෙරමුණ තවමත් එම සටනේ නියැලී සිටී.

සටන් විරාම ගිවිසුමට වසර 05ක් සපිරුණේ පසුගිය පෙබරවාරි මස 21 වැනිදාටය. ඊට පෙර එය අහෝසි කළ යුතු බවත්, නැත්නම් ගිවිසුම හරහා එල්.ටී.ටී.ඊ. සංවිධානයට උතුරේ වෙනම ඊළාම් රාජ්‍යයක් පිළිබඳ පිළිගැනීමක් ජාත්‍යන්තර ප්‍රජාව තුළ හිමිවන බව ජනතා විමුක්ති පෙරමුණේ තර්කය විය.

දැන් වසර 05ක් සම්පූර්ණ වී හමාරය. ඒත් ගිවිසුම ඉරා දැමීමක් සිදුවූයේ නැත. ජාත්‍යන්තර ප්‍රජාව වෙනම ඊළාම් රාජ්‍යයක් පිළිගත් බවට දැන ගන්නටද තවම නැත. කෙසේ වෙතත්, දීර්ඝ කාලීන වශයෙන් ගත්තත්, කෙටි කාලීන වශයෙන් ගත්තත්, අපට මෙම ගිවිසුම ඉතාම අහිතකරය. එබැවින් එය අහෝ සි කළ යුතුය. ඒ ගැන කිසිඳු තර්ක විතර්කයක් තිබිය නොහැක.

ජනතා විමුක්ති පෙරමුණ මහින්ද රාජපක්ෂ මහතාව ජනාධිපති කිරීමේ සටනේ සිටි ප්‍රධාන බල ඇණියකි. ඒ ගැන කිසිඳු විවාදයක් නැත. නමුත් අද ඔවුන් රාජපකෂ ආණ්ඩුවෙන් ඉවත් වී ඇත. ඒ ජනතා විමුක්ති පෙරමුණ සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම ඇතුළු ඉල්ලීම් 20ක් ඉෂ්ඨ කරන ලෙස රාජ්‍ය ආණ්ඩුවට දෙන ලද යෝජනාවලිය ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙනය.

ජනතා විමුක්ති පෙරමුණ රාජපක්ෂ ආණ්ඩුව තුළ සටන් විරාම ගිවිසුම පිළිබඳව දැඩි ස්ථාවරයක සිට කටයුතු කලත්, ඔවුන් ඇමැතිධූර දැරූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ආණ්ඩුව තුළ එම දැඩි ස්වභාවය තිබුණේ නැත. එම පක්ෂය එම ආණ්ඩුවෙන් ඉවත් වුණේ සටන් විරාම ගිවිසුම නිසා නොව, ''සුනාමි සහන මණ්ඩලය'' නිසාය.

සටන් විරාම ගිවිසුම හොඳ නැත්නම්, එදත්, අදත්, හෙටත් එය හොඳ නැත. එබැවින් අද රාජපක්ෂ ආණ්ඩුවට ගිවිසුම අහෝසි කළයුතු බවට දැඩි නීති පනවන ජ.වි.පෙ. එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක ආණ්ඩුවට එම නියෝගය දැඩි ලෙස පැනවූවේ නැත්තේ ඇයිද යන්න ප්‍රශ්නයකි. ගිවිසුම හොඳ නැත්නම් එය අහෝසි කරන ලෙස එදා විපක්ෂයේ සිටි එක්සත් ජාතික පක්ෂය ඇමැතිධූර දරමින් ආණ්ඩුවේ සිටි ජනතා විමුක්ති පෙරමුණෙන් ඉල්ලීම් කළහ. නමුත් එයට ප්‍රතිචාර දක්වමින් ජ.වි.පෙ. ප්‍රකාශ කර සිටියේ ''ගිවිසුම යනු කාල බෝම්බයක්. එ.ජා.පය අපට දීලා තියෙන්නේ භයානක බෝම්බයක්. ඒක නිසා එක්සත් ජාතික පක්ෂය කියන කියන විදියට මෙය නිෂ්ක්‍රිය කරන්න බෑ. එය ඉතාම අරපරිස-'සමින් කළයුතු දෙයක් බවය.

එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක ආණ්ඩුව තුළ ගිවිසුම පිළිබඳ එවැනි තර්ක විතර්ක ගොඩනගමින් කාලය ගෙවූ ජනතා විමුක්ති පෙරමුණ අද රාජපක්ෂ ආණ්ඩුවට ගිවිසුම ගැනන මෙතරම් පීඩනයක් එල්ල කරන්නේ ඇයිද? යන්න යම් කිසිවෙකුට ප්‍රශ්නයක් මතුවීමට බැරි නැත.

එදා එක්සත් ජාතික පක්ෂය මගින් ඇටවූ මෙම කාල බෝම්බය චන්ද්‍රිකා ජනතා විමුක්ති පෙරමුණටත්, ආණ්ඩුවටත්, නිෂ්ක්‍රිය කරන්න බැරි වුණා නම්, මහින්ද හෙළ උරුමය ආණ්ඩුය එය නිෂ්ක්‍රිය කරන්නේ කෙසේද? යන තර්කය ද මතුවීමට බැරි නැත. නමුත් කරන්න බැරි කමක් නැත. කරන්න පුළුවන්ය. සිදුවී ඇත්තේ නොකිරීමය. චන්ද්‍රිකාත්, මහින්දත් බලය ලබා ගත්තේ ගිවිසුම අහෝසි කරන බවට ප්‍රතිඥා දෙමිනි. ඒත් දෙදෙනාම සිදුකළේ එය අහෝසි කිරීම නොව තවදුරටත් ආරක්ෂා කිරීමය.

කරන්න බැරි නම්, ඒ බව ජනතාවට පැහැදිලිව ප්‍රකාශ කිරීමේ හැකියාව තිබිණි. එසේ කතා කර අහෝසි කරන බවට පවසා නොකර සිටීම බලවත් වරදකි. ජාතික හෙළ උරුමය ප්‍රකාශ කර සිටින්නේ ''සටන් විරාම ගිවිසුම'' ජ.වි.පෙ. ප්‍රකාශ කරන තරම් දරුණු යකෙක් නොවන බවය. 1987 දී ජේ.ආර්. ජයවර්ධන මහතා ඉන්දු ලංකා ගිවිසුමම අත්සන් කළ මොහොතේත් ජ.වි.පෙ. ඒ ගැන යකෂ රූපයක් මවා පෙන්වීමට උත්සාහ කළේය.

නමුත් එය ගිවිසුම කාලයාගේ ඇවෑමෙන් නිෂ්ක්‍රිය වී ගියේය. ජ.වි.පෙ. ප්‍රකාශ කළ තරම් බරපතල තත්ත්වයක් ඉන් ඇති වුණේ නැත. එබැවින් දැන් සටන් විරාම ගිවිසුම ගැනත්, ජ.වි.පෙ. ප්‍රකාශ කරන තරම් බරපතල ස්වභාවයක් නැති බව හෙළ උරුමය පවසයි.